විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation


මගේ අංකය / எனது இல. / My No. Pen/Pol/06/12-2023    ඔබේ අංකය / உமது இல. / Your No. ..........    දිනය / திகதி / Date 2024.03.21

විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 02/2020 (සංශෝධන II)

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

<u>විශ්‍රාමිකයන්ගේ තොරතුරු පිටතට ලබා නොදීම</u>

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී 2023.11.29 දින පැවති ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ දී, එහි සභාපතිවරයා විසින් ලබා දෙන ලද උපදෙස් පරිදි 2023.12.31 දිනට එක් එක් දිස්ත්‍රික්කවල විශ්‍රාම වැටුප් ගෙවීම් කරනු ලැබූ සියලුම විශ්‍රාමිකයින් පිළිබඳ පහත තොරතුරු විද්‍යුත් තැපැල ඔස්සේ 2024.01.10 දින ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

- විශ්‍රාමිකයාගේ නම
- විශ්‍රාමිකයාගේ ලිපිනය
- විශ්‍රාමිකයා අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

02. ඉහත තොරතුරු දිස්ත්‍රික්කය තුළ විශ්‍රාමිකයින්ගේ සුභසාධන කටයුතුවල යෙදෙන ලියාපදිංචි විශ්‍රාමික සංගමයන් හි සභාපති හෝ ලේකම්වරයා විසින් ඉල්ලා සිටියහොත් පමණක් ලබා දීමට කටයුතු කළ යුතු ය.

03. මෙම තොරතුරු මැතිවරණ හෝ දේශපාලන කටයුතු සඳහා හෝ යොදා නොගත යුතු බවට තොරතුරු ඉල්ලුම්කරුවන් දැනුම්වත් කළ යුතු ය.

04. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් 2020.07.13 දිනැතිව නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 02/2020 හා 2023.10.16 දිනැතිව නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 02/2020 (සංශෝධන I) මෙමඟින් අවලංගු කරනු ලැබේ.

**ඒ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :**

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
2. මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.
3. ලේකම්, ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව - කරු.දැ.ගැ.ස.


**මාළිගාවත්ත, කොළඹ 10.** மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.

Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk